සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 44 - ඉස්ලාම්

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2020 (නව නිර්දේශය)

## 44 - ඉස්ලාම්

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

මෙම විෂයයේ දෙවන ප්‍රශ්න පත්‍රයේ කොටස් දෙකක් තිබේ. එයින් I කොටසෙන් ප්‍රශ්න 02 ක් ද, II කොටසෙන් ප්‍රශ්න 03 ක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට උත්තර සපයා දිය යුතුය.

**I කොටස**

ප්‍රශ්න දෙකකට - 02 x 20 = ලකුණු 40 යි

**II කොටස**

ප්‍රශ්න තුනකට - 03 x 20 = ලකුණු 60 යි

**එකතුව**

ප්‍රශ්න පහකට - 40 + 60 = ලකුණු 100 යි

අවසන් ලකුණු ලබා දීමට

I ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි

II ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි

**අවසන් ලකුණු = 200 ÷ 02 = ලකුණු 100 යි**

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ................................................
................................................ √ △ $\frac{4}{5}$
................................................

(ii) ................................................
................................................ √ △ $\frac{3}{5}$
................................................

(iii) ................................................
................................................ √ △ $\frac{3}{5}$
................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ඉස්ලාම් I<br>இஸ்லாம் I<br>Islam I | 44 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා** දක්වන්න.

**1.** අල්ලාහ්ට අයත් වාජිබ් වූ ගුණාංගවලින් 'සම්උඃන්' යන ගුණාංගයේ අර්ථය වන්නේ,
(1) ශක්තියයි. (2) දෘෂ්ටියයි. (3) අධිෂ්ඨානයයි. (4) ශ්‍රවණයයි. (5) ප්‍රාණයයි.

**2.** 'කලීලුල්ලාහ්' යන අන්වර්ථ නාමයෙන් හැඳින් වූ දේවදූතයාණන්,
(1) ඉබ්රාහීම් (අලෛ) වේ. (2) මූසා (අලෛ) වේ. (3) නූහ් (අලෛ) වේ.
(4) ඊසා (අලෛ) වේ. (5) ආදම් (අලෛ) වේ.

**3.** කුහකයා යන්න සඳහා භාවිත වන අරාබි වචනය කුමක් ද?
(1) මූෂ්රික් (2) මුල්හිද් (3) මූනාෆික් (4) කාෆිර් (5) මූර්තද්

**4.** "ධර්මයෙහි බලකිරීමක් නැත." යන්න,
(1) කුර්ආන් වාක්‍යයක් වේ. (2) ඉජ්මාඃ නිගමන ය.
(3) කියාස් නිගමනය වේ. (4) හදීස් වේ.
(5) විද්වතෙකුගේ ප්‍රකාශයකි.

**5.** 'කත්මුන් නුබුව්වා' යන්නෙන් අදහස් වන්නේ,
(1) නබිත්වය ආරක්ෂා කිරීම වේ. (2) අවසාන නබිත්වය වේ.
(3) නබිවරුන්ට මුද්‍රාවකි. (4) නබිවරුන්ගේ නායකයා යන්න ය.
(5) නබිත්වය ප්‍රතික්ෂේප කිරීම ය.

**6.** නිශ්ශබ්ද ඉජ්මාව හැඳින්වෙන වචනය වන්නේ,
(1) සරීහ් ය. (2) කෞලි ය. (3) මුරක්කබ් ය.
(4) අක්සරියියා ය. (5) සුකූති ය.

**7.** අල්-කුර්ආන් හි ඇති දීර්ඝතම සූරාවෙහි නම කුමක් ද?
(1) සූරාහ් ආල ඉම්රාන් (2) සූරතුන් නිසා (3) සූරතුත් තව්බා
(4) සූරතුල් බකරා (5) සූරතුල් අඃරාෆ්

**8.** හදීස්වල මූල වාක්‍යය කෙසේ හැඳින්වේ ද?
(1) මතන් (2) සනද් (3) කබර් (4) ඉස්නාද් (5) රිවායත්

**9.** පහත සලාතයන්ගෙන් කුත්බා (දේශනය) **නොපැවැත්වෙන** සලාතයන්,
(1) ජුම්ආ වේ. (2) ඉස්තිකාරා වේ. (3) ඉස්තිස්කා වේ.
(4) ඊ දෙදින් වේ. (5) කුසූෆයින් වේ.

**10.** මුස්ලිම්වරයකුගේ සේවාවල 'ඉමාරත්' පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ලෝකය ශක්තිමත් කිරීම ය.　　(2) පරලොව වෙනුවෙන් ක්‍රියා කිරීම ය.
(3) දෙවියන් වෙනුවෙන් ක්‍රියා කිරීම ය.　　(4) පවුල් ජීවිතයෙහි යෙදීම ය.
(5) අධ්‍යාත්මික ජීවිතයෙහි යෙදීම ය.

**11.** පහත අංශවලින් 'මක්සද්' යන්නෙහි භාෂාමය අර්ථ අන්තර්ගත වරණය කුමක් ද?
(1) විශ්වාසය, අවංකත්වය සහ යුක්තිය
(2) ඉලක්කය, සාර්ථකත්වයට ළඟාවීම සහ අභිලාෂය
(3) ජීවිතය, මරණය සහ ක්‍රියාවන්
(4) සතුට, ශෝකය සහ සිනාව
(5) අදහස, මතය සහ තීරණය

**12.** උපවාසය 'කළා' කිරීම යන කොන්දේසියට යටත්ව උපවාසය නැවැත්වීමට අවසර **නොමැති** තැනැත්තා,
(1) මගියා ය.　　(2) සුවය ලැබිය හැකි රෝගියා ය.
(3) ගර්භනී කාන්තාව ය.　　(4) කිරි පොවන මව ය.
(5) දුගියා ය.

**13.** එළුවන් 250 දෙනෙකු තබාගෙන සිටින්නෙකු zසකාත් වශයෙන් දිය යුතු එළුවන් සංඛ්‍යාව,
(1) එකෙකි.　　(2) දෙදෙනෙකි.　　(3) තුන්දෙනෙකි.
(4) හතරදෙනෙකි.　　(5) පස්දෙනෙකි.

**14.** 'අයියාමුත් තෂ්රීක්' දිනවලදී උපවාසයෙහි යෙදීම,
(1) මක්රූහ් වේ.　(2) සුන්නත් වේ.　(3) ෆර්ළ් වේ.　(4) හරාම් වේ.　(5) මුබාහ් වේ.

**15.** හජ් වන්දනාකරුවන් දුල්හජ් නවවන දිනයේ රැඳී සිටිය යුතු ස්ථානය,
(1) මිනා ය.　　(2) මක්කා ය.　　(3) මදීනා ය.
(4) යලම්ලම් ය.　　(5) අරෆා ය.

**16.** හජ් සහ උම්රා වන්දනාවේ දී ඉටුකරනු ලබන පොදු අධ්‍යාත්මික ක්‍රියාව කුමක් ද?
(1) අරෆාහි නිම්නයේ රැඳී සිටීම　　(2) මිනාහි රැඳී සිටීම　　(3) තවාෆ් සිදුකිරීම
(4) ජම්රාහි ගල් ගැසීම　　(5) කුර්බාන් ඉටුකිරීම

**17.** ඉස්ලාමීහි වර්ධනයට මහඟු සේවාවක් කළ තරීකාවරුන් අතුරෙන් කෙනෙකු වන්නේ,
(1) අෂ් අරියියා ය.　　(2) කාදිරියියා ය.　　(3) ඉස්මාඊලියියා ය.
(4) වාසිලියියා ය.　　(5) තහාවියියා ය.

**18.** අල්-කුර්ආන්හි 'තර්තීබුත් තිලාවත්' යන පදයෙන් කුමක් හඳුන්වන්නේ ද?
(1) පාරායනය කරන පිළිවෙළ　　(2) පහළ කිරීමේ අනුපිළිවෙළ
(3) පහළ කිරීමට හේතුව　　(4) පහළ කිරීමේ පියවරවල්
(5) පාරායන කිරීමේ නීතිය

**19.** 'අස්ලීල්' හි දක්නට ඇති 'ඉල්ලත්'වලට වඩා 'ෆර්උ' හි දක්නට ඇති 'ඉල්ලත්' වටිනාකම අධිකව ඇත්නම් එය,
(1) කියාස් මුසාවි වේ.　　(2) කියාස් අව්ලා වේ.　　(3) කියාස් ජෙලී වේ.
(4) කියාස් අද්නා වේ.　　(5) කියාස් කෆී වේ.

**20.** සාමූහික වශයෙන් ඉටුකරන ඉජ්තිහාද් හඳුන්වන්නේ,
(1) ජමාඊ ලෙස ය.　　(2) අක්සරියියා ලෙස ය.　　(3) ෆර්දී ලෙස ය.
(4) ඉන්ෂාඊ ලෙස ය.　　(5) ඉන්තිකාඊ ලෙස ය.

**21.** හජ් හා සම්බන්ධ පහත සඳහන් අධ්‍යාත්මික ක්‍රියාවලින් හජ්හි ෆර්ලුවලට ඇතුළත් **නොවන්නේ** කුමක් ද?
(1) අරෆාහි රැඳී සිටීම　　(2) ජම්රාවල ගල්ගැසීම
(3) තවාෆුල් ඉෆාදා කිරීම　　(4) සඊ කිරීම
(5) හිසකෙස් මුඩුගෑම හෝ කැපීම

**22.** පහත සඳහන් දෑ අතුරින් ෆර්ලු අයින්වලට නිදසුනක් සහිත වරණය වන්නේ,
(1) ජනාසාවකට අදාළ යුතුකම් ඉටුකිරීම ය.
(2) තමාගේ වේතනයට අදාළ කාර්යභාරය ඉටුකිරීම ය.
(3) අනාථයින් රැකබලා ගැනීම ය.
(4) මස්ජිදයක් ඉදිකිරීම ය.
(5) වෛද්‍යවරයෙක් බිහිකිරීම ය.

**23.** 'ෆික්හුල් අක්බර්' සහ 'මුඅත්තා' යන ග්‍රන්ථවල ලේඛකයින් පිළිවෙළින්,
(1) නසාඊ (රහ්), තිර්මිදි (රහ්) වේ.
(2) බුහාරි (රහ්), මුස්ලිම් (රහ්) වේ.
(3) අබූදාවූද් (රහ්), තිර්මිදි (රහ්) වේ.
(4) අබූ හනීෆා (රහ්), මාලික් (රහ්) වේ.
(5) කුර්තුබි (රහ්), ෂාෆිඊ (රහ්) වේ.

**24.** කෙනෙකු තමාගේ දේපළවලින් කුමක් හෝ ජනයාගේ ප්‍රයෝජනය සඳහා තම හිමිකමෙන් මුදවා හැරීම හැඳින්වෙන්නේ,
(1) ඉජාරා ලෙස ය.
(2) වක්ෆු ලෙස ය.
(3) වකාලා ලෙස ය.
(4) තිජාරා ලෙස ය.
(5) මුසාරආ ලෙස ය.

**25.** ගනුදෙනු ක්‍රම අතුරෙන් 'අර්රහ්න්' යන්නට අදාළ සිංහල පදය,
(1) කුලිය වේ.
(2) ණය වේ.
(3) උගස වේ.
(4) තැරැව් ගාස්තුව වේ.
(5) වගකීම වේ.

**26.** විවාහයක දී මනමාලයා මනමාලියට දිය යුතු දීමනාව හඳුන්වන්නේ කෙසේ ද?
(1) සදකා (2) මහර් (3) නෆකා (4) හිබත් (5) කිස්වා

**27.** තාවකාලිකව විවාහවීමට අනුමැතිය **නොමැති** අය වන්නේ,
(1) මවගේ සහෝදරියයි.
(2) බිරිඳගේ මවයි.
(3) පියාගේ සහෝදරියයි.
(4) පුතාගේ බිරිඳයි.
(5) බිරිඳගේ සහෝදරියයි.

**28.** දික්කසාද ක්‍රමවලින් එකක් වන 'ලිආන්' හි අදහස කුමක් ද?
(1) තලාක්වලින් පසු සිදුවන දික්කසාද
(2) බිරිඳ තම මවට සමකිරීමෙන් සිදුවන දික්කසාද
(3) භාර්යාව ස්වාමියාගෙන් ලබාගන්නා දික්කසාද
(4) ස්වාමි පුරුෂයා භාර්යාව වෛශ්‍යාවක් ලෙස වරදපටවා ලබාගන්නා දික්කසාද
(5) බලහත්කාරයෙන් සිදුකරන දික්කසාද

**29.** 'තස්කියියතුන් නෆ්ස්' යන්නෙන් පාරිශුද්ධ භාවය ඇතිකරන්නේ කුමක ද?
(1) සිත (2) ශරීරය (3) ස්ථානය (4) වටපිටාව (5) ඇඳුම්

**30.** කුඩාවියේදී ම ධාර්මික දැනුම හා තෆ්සීර් අර්ථ විවරණ හැකියාව දායක කිරීමට නබි (සල්) තුමා විසින් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ සහාබි,
(1) අබ්දුල්ලා ඉබ්නු අබ්බාස් (රලි) වේ.
(2) අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රලි) වේ.
(3) අබ්දුල්ලා ඉබ්නු උමර් (රලි) වේ.
(4) සෛද් ඉබ්නු සාබිත් (රලි) වේ.
(5) අලි ඉබ්නු අබී තාලිබ් (රලි) වේ.

**31.** හදීස් එක්රැස් කිරීම ආරම්භ කිරීම සඳහා ඉමාම් සුහ්රි තුමාව උනන්දු කර වූ පාලකයා වන්නේ,
(1) උමර් ඉබ්නු කත්තාබ් (රලි) ය.
(2) උස්මාන් ඉබ්නු අෆ්ෆාන් (රලි) ය.
(3) අබ්දුල් මලික් ඉබ්නු මර්වාන් (රග්) ය.
(4) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රග්) ය.
(5) මු ආවියා ඉබ්නු අබි සුෆ්යාන් (රලි) ය.

**32.** ක්‍රි.ව. 1283 දී යාපහුව රාජධානිය පාලනය කළ රජු විසින් ඊජිප්තුවට යැවූ වෙළඳ දූත පිරිසෙ නායකත්වය දැරුවේ කවුරුන් ද?
(1) ඉබ්රාහිම්
(2) අබූ උස්මාන්
(3) අබ්දුල් කරීම්
(4) ඉබ්නු බතූතා
(5) අබූ සුලෛමාන්

**33.** 'අල් ඉමාමුල් අඃලම්' යනුවෙන් හා 'ඉමාමුල් මදීනා' යනුවෙන් හැඳින් වූ ඉමාම්වරු පිළිවෙළින්,
(1) ඉමාම් අබූ හනීෆා (රහ්) සහ ඉමාම් අහ්මද් (රහ්) වේ.
(2) ඉමාම් කුර්තුබි (රහ්) සහ ඉමාම් තබරි (රහ්) වේ.
(3) ඉමාම් අහ්මද් (රහ්) සහ ඉමාම් තිර්මිදි (රහ්) වේ.
(4) ඉමාම් බුහාරි (රහ්) සහ ඉමාම් මුස්ලිම් (රහ්) වේ.
(5) ඉමාම් අබූහනීෆා (රහ්) සහ ඉමාම් මාලික් (රහ්) වේ.

**34.** ඉස්ලාම් ඉතිහාසයේ 'සූෆිවරු' ලෙස හඳුන්වන අය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ෆුලෙල් ඉබ්නු ඉයාල්, වරකත් ඉබ්නු නව්ෆල් සහ අබ්දුල්ලා ඉබ්නු මස්ඌද් (රළි).
(2) ෂකීක් අල්බල්කි, අබූ හාමිද් අල් ගස්සාලි සහ ඉබ්නු අබ්බාස් (රළි)
(3) ඉබ්රාහීම් ඉබ්නු අද්හම්, ෆුලෙල් ඉබ්නු ඉයාල් සහ ෂකීක් අල්බල්කි (රහ්)
(4) අබූහාමිද් අල් ගස්සාලි, ඉබ්නු අරබි සහ තාවූස් (රහ්)
(5) ඉබ්නු අරබි, අබ්දුල් කාදිර් ජිලානි (රහ්) සහ අබ්දුල්ලා ඉබ්නු උමර් (රළි)

**35.** කරීම්, නලීර්ගෙන් රු. 10 000 000 ලබාගෙන නිෂ්පාදනයක නිරත වේ. මෙමගින් ලැබෙන ලාභය දෙදෙනා සමානව බෙදා ගන්නා අතර අලාභයක් සිදුවන්නේ නම් එය නලීර් භාරගන්නා බව තීරණය කර තිබුණි. මේ ආකාරයේ හවුල් ව්‍යාපාරය,
(1) මුෂාරකා වේ. (2) මුලාරබා වේ. (3) මුසාරආ වේ. (4) ඉජාරා වේ. (5) මුරාබහා වේ.

**36.** පහත අය අතුරෙන් ෆික්හ් කලාවේ විද්වතුන් පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) අබූ හනීෆා (රහ්), ෂාෆිඊ (රහ්), අබූ යූසුෆ් (රහ්)
(2) මාලික් (රහ්), බුහාරි (රහ්), අබූදාවූද් (රහ්)
(3) ෂාෆිඊ (රහ්), මුස්ලිම් (රහ්), නසාඊ (රහ්),
(4) අහ්මද් ඉබ්නු හන්බල් (රහ්), තිර්මිදි (රහ්), මාලික් (රහ්)
(5) ගස්සාලි (රහ්), ඉබ්නු මාජා (රහ්), නවවි (රහ්)

**37.** නබිවරුන්ගේ මූලික ගුණාංග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ෆතානත්, කියානත්, අමානත්, තබ්ලීක් (2) සිද්ක්, බලාදත්, කිත්බ්, ෆතානත්
(3) තබ්ලීක්, කිත්මාන්, අමානත්, කියානත් (4) සිද්ක්, බලාලත්, කියානත්, තබ්ලීක්
(5) සිද්ක්, අමානත්, ෆතානත්, තබ්ලීක්

**38.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - හනෆි මද්හබ්හි නිර්මාතෘ
B - අර්රිසාලා යන ග්‍රන්ථයේ කර්තෘ
C - ආලිමුල් කුරෛෂ් යන අන්වර්ථ නාම ලද පුද්ගලයා
D - බසරාහි ඉපදුන පුද්ගලයා
E - උසූලුල් ෆික්හු කලාවේ පුරෝගාමියා
ඉහත කරුණු අතුරෙන් ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා සම්බන්ධ නිවැරදි තොරතුරු පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) A B C (2) A C D (3) B C D (4) B C E (5) B D E

**39.** පහත සඳහන් ක්ෂේත්‍ර සලකා බලන්න.
A - ඉල්මුත්තාරීක්
B - ඉල්මුල් ජරහ් වත්තඃදීල්
C - ඉල්මුල් ෆරා ඉල්
D - අස්මා උර් රිජාල්
E - උසූලුල් හදීස්
ඉහත සඳහන් ක්ෂේත්‍ර අතුරෙන් සුන්නාව ආරක්ෂා කිරීමට පමණක් බිහි වූ ක්ෂේත්‍ර සහිත පිළිතුර තෝරන්න.
(1) A B C (2) A B E (3) B C D (4) B C E (5) B D E

**40.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - සියලු සම්පත් අල්ලාහ්ට හිමි ය.

B - මිනිසා ඉපයූ සියල්ලම ඔහුට අයත් වේ.

C - තම ධනය පිළිබඳව මිනිසා පරලොව දී විභාග කෙරෙනු ඇත.

D - ධනය රැස්කිරීමට මිනිසා දරණ උත්සාහය ඔහුට ප්‍රයෝජනවත් විය යුතු ය.

E - අල්ලාහ් මිනිසා වෙනුවෙන් සම්පත් උත්පාදනය කර ඇත.

ඉහත ප්‍රකාශවලින් ඉස්ලාමීය ආර්ථිකය පදනම් වූ සංකල්ප පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) A B C (2) A C D (3) A C E (4) B D E (5) C D E

**41.** අල්ලාහ් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - සියලු නමස්කාරයන්ට අයත්වන්නා

B - විශ්වයේ මැවුම්කරු

C - මිනිස් ජීවිතයට නීති සම්පාදනය කරදෙනු ලබන්නා

D - සියලු කටයුතු සැලසුම් කොට ක්‍රියාත්මක කරන්නා

E - අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ප්‍රාර්ථනා කිරීමට යෝග්‍යවන්නා

F - ආදරය දැක්වීමට සුදුස්සා

ඉහත ප්‍රකාශ අතුරෙන් උලූහියියා පිළිබඳ අර්ථය දැක්වෙන වරණය තෝරන්න.

(1) A B C D (2) A B C E (3) A B C F (4) A C E F (5) B C D F

**42.** මක්කී, මදනී සූරාහි විශේෂත්ව පහතින් පෙන්නුම් කරයි.

A - බහු අර්ථ වචන, ශබ්ද ලයාන්විත බව

B - දීර්ඝ වචන, දීර්ඝ සූරාවන්

C - තව්හීදය ස්ථිර කිරීම

D - සමාජ නීති ඉදිරිපත් කිරීම

E - පරලොව ජීවිතය පිළිබඳ ඉගැන්වීම්

F - 'මිනිසානෙනි' යනුවෙන් පොදුවේ ප්‍රකාශ කිරීම

ඉහත කොටස්වලින් මක්කී සූරාවට අයත් විශේෂත්වයන් පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) A B E F (2) A C E F (3) B C D E (4) B C E F (5) B D E F

- අංක **43** සිට **45** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ දී ඇති තොරතුරු කිසියම් ක්‍රමයකින් එකිනෙක හා සැසඳේ. ඒ අනුව **X** තීරුවේ ඇති තොරතුරුවලට අනුපිළිවෙළ අනුව **Y** තීරුවේ ඇති තොරතුරු නිවැරදිව පෙළගස්වා ඇති වරණය තෝරන්න.

**43.**

| X | Y |
|---|---|
| (i) සබ්ර් | A - දේව හැඟීම |
| (ii) සුහ්ද් | B - ඉවසීම |
| (iii) රිලා | C - ආරක්ෂා කිරීම |
| (iv) වරඃ | D - තෘෂ්ණාවෙන් තොර ජීවිතය |
| (v) තක්වා | E - දේව තෘප්තිය |

(1) A B D E C (2) B D E C A (3) B E D C A (4) C D E B A (5) D E C B A

**44.**

| X | Y |
|---|---|
| (i) මිඃරාජ් | A - මුහර්රම් 10 සඳ |
| (ii) යව්මුත් තර්වියා | B - ෂව්වාල් 01 සඳ |
| (iii) යව්මුන් නහ්ර් | C - රජබ් 27 සඳ |
| (iv) ඊදුල් ෆිත්ර් | D - දුල්හජ් 08 සඳ |
| (v) ආෂූරා | E - දුල්හජ් 10 සඳ |

(1) A B C D E (2) A D E B C (3) B D E A C (4) C D E B A (5) D A E C B

**45.**

| X | Y |
|---|---|
| (i) ඉමාම් මුස්ලිම් (රහ්) | A - බුකාරා |
| (ii) ඉමාම් බුහාරි (රහ්) | B - මදීනා |
| (iii) ඉමාම් මාලික් (රහ්) | C - නයිසාබූර් |
| (iv) ඉමාම් අහ්මද් (රහ්) | D - කුරාසාන් |
| (v) ඉමාම් තිර්මිදි (රහ්) | E - බැග්ඩෑඩ් |

(1) A B D C E (2) A C B D E (3) B A C D E (4) C A B D E (5) C A B E D

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | ෆික්හ් ක්ෂේත්‍රයේ යෙදුනු විද්වතුන් හදීස් ක්ෂේත්‍රයේ ද සුදුසුකම් ලබා තිබිය යුතු ය. | ඉමාම් අහ්මද් ඉබ්නු හම්බල් (රහ්) හා ඉමාම් මාලික් (රහ්) යන අය ෆික්හ් හා හදීස් ක්ෂේත්‍රවල සුදුසුකම් ලබා ඇත. |
| **47.** | 'උර්ෆු' එක් ප්‍රධාන ඉස්ලාමික නීති මූලාශ්‍රයකි. | හරාමයට මඟපාදන සියල්ල හරාම් වේ. |
| **48.** | ඉමාම් ඉබ්නු ජරීර් අත්තබරි, ජාමිඋල් බයාන් යන ග්‍රන්ථයේ කතෘ වේ. | ක්‍රියා සියල්ල අධිෂ්ඨානයක් පදනම් කොටගෙන තීර්ණය වේ. |
| **49.** | ඉජ්තිහාද්හි ප්‍රවේශ මාර්ගය වසා ඇත. | බනූ කෛනුකා යනු මක්කා හි සිටි ගෝත්‍රයක් වේ. |
| **50.** | ප්‍රතිවිරුද්ධ අදහස් නැතිකර දැමීම අපහසු වේ. | යහපත් අරමුණු සඳහා හරාමය සිදුකිරීම වැරදි නොවේ. |

❊ ❊ ❊

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

## නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

විෂයය අංකය / பாட இலக்கம: **44**

විෂයය / பாடம்: **ඉස්ලාම්**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 2 | 31. | 4 | 41. | 4 |
| 02. | 1 | 12. | 5 | 22. | 2 | 32. | 2 | 42. | 2 |
| 03. | 3 | 13. | 3 | 23. | 4 | 33. | 5 | 43. | 2 |
| 04. | 1 | 14. | 4 | 24. | 2 | 34. | 3 | 44. | 4 |
| 05. | 2 | 15. | 5 | 25. | 3 | 35. | 2 | 45. | 5 |
| 06. | 5 | 16. | 3 | 26. | 2 | 36. | 1 | 46. | 5 |
| 07. | 4 | 17. | 2 | 27. | 5 | 37. | 5 | 47. | 2 |
| 08. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 4 | 48. | 1 |
| 09. | 2 | 19. | 2 | 29. | 1 | 39. | 5 | 49. | 4 |
| 10. | 1 | 20. | 1 | 30. | 1 | 40 | 3 | 50 | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | |
|---|---|
| ඉස්ලාම් | II |
| இஸ்லாம் | II |
| Islam | II |

44 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඉස්ලාම් යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) ඉස්ලාම්හි විශේෂ අංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) ඉස්ලාම්හි පදනම් මූලාශ්‍රයන් සඳහන් කොට එයින් **එකක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iv) රිසාලත්, හිදායත් ලබාගැනීමේ මාධ්‍යයක් වන බව නබිවරුන්ගේ ඉතිහාසය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**2.** (i) ඉජ්තිහාද්වලට අල්-කුර්ආන්හි සඳහන් කර ඇති මූලාශ්‍රයන්ගෙන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි.)

(ii) පරස්පර අදහස් තිබෙන විටක දී රැකගත යුතු, ඉස්ලාම් අවධාරණය කර ඇති පිළිවෙත් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) 'කෞලුස් සහාබි' යන්න පැහැදිලි කොට, එය නීති මූලාශ්‍රයක් ලෙස පිළිගැනීමට සාධාරණ හේතු **දෙකක්** හා ප්‍රතික්ෂේප කිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

(iv) මුස්ලිම්වරයකුගේ ගෘහ ජීවිතය, ගෘහයේ භෞතික පිහිටීම හා භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමීය මඟපෙන්වීම්වලින් **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08 යි.)

**3.** (i) 'ඉබාදත්' යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) Zසකාත් ලබාදෙන්නාට ලැබෙන ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) හජ් හි අධ්‍යාත්මික හා ලෞකික ප්‍රයෝජන එකකට **තුන** බැගින් සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

(iv) ඉස්ලාම් හි මූලික යුතුකම් හා අඛ්ලාක් අතර පවතින සබඳතාවය සාධක සහිතව විස්තර කරන්න. (ලකුණු 08 යි.)

## II කොටස

**4.** (i) ඉස්ලාම්හි ෂරීආ ගැන සඳහන් කොට, දීන් හා ෂරීආ අතර පවතින වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(ii) විශ්වය, මිනිසා හා ජීවිතය පිළිබඳව ඉස්ලාමීය දෘෂ්ටිකෝණය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

**5.** (i) ඉස්ලාම් අනුමත කළ වෙළඳ ක්‍රම **හතරක්** ගැන සඳහන් කොට, වෙළඳාම සඳහා වූ කොන්දේසි විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(ii) කර්මාන්තවලට ඉස්ලාම්හි ලබා දී ඇති වැදගත්කම නබිවරුන්ගේ ඉතිහාසය හා සම්බන්ධ කර විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**6.** (i) සුබසාධනය පවත්වාගැනීම පිළිබඳ ඉස්ලාමීය මතය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ඉස්ලාම් ලබා දී ඇති ස්ත්‍රී පුරුෂ සමානතාවයෙහි ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රමවේද **පහක්** විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**7.** (i) 'අල්-ඉල්හාද්' යන්න අර්ථ දක්වා එහි බිහිවීම, වර්ධනය හා ඉස්ලාම් ලෝකයට එයින් ඇති වූ බලපෑම් ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(ii) මුස්ලිම්වරයකුගේ දෛනික ක්‍රියාකාරකම්වල දී හුකූකුල්ලාහ්, හුකූකුල් ඉබාද් ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**8.** පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය (ලකුණු 05 යි.)

(ii) කර්දුල් හසන් (ලකුණු 05 යි.)

(iii) ඉස්ලාම්හි ඉගැන්වීම් අනුව දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ යුතුකම් (ලකුණු 05 යි.)

(iv) ප්‍රවේනි උරුම නීතියෙහි අල්-හජ්බ් (ලකුණු 05 යි.)

* * *

## I කොටස

**1.** (i) ඉස්ලාම් යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 02 යි.)

(i) සිල්ම් යන පදයෙන් විකසන වී ඇත.

ශාන්ති, පරිශුද්ධය, නිහතමානිකම. ආරක්ෂාව, යටත්වීම, පාලනය කිරීම යන අර්ථ හඟවයි.

ඉස්ලාමීය පරිභාෂමය තේරුම:-

මුහම්මද් නබි (සල්) අමානත් ගෙන ආ සියළු දේ/ සියළු විෂයන් අන්තර්ගත වූ ජීවන රටාවය.

(පද විග්‍රහයට ලකුණක් ද, විග්‍රහයට ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙනන්)

(ii) ඉස්ලාම්හි විශේෂ අංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

- දේවත්වය තිබීම (රබ්බානියා).
- සමතුලිතතාවය (තවාසුන්).
- මධ්‍යස්ථභාවය (වසතියියා).
- මනුෂ්‍යත්වය තිබීම (ඉන්සානියියා).
- පරිපූර්ණත්වය තිබීම (සුමූලියියා).
- ප්‍රායෝගිකව හැකි ආගමක් (වාකිඉයියා).
- ජාත්‍යන්තර ආගමක් (ආලමියියා).
- පැහැදිලිතාවය (වුලුහ්)/ පැහැදිලි ආගමකි.
- සියලු කාලය හා ස්ථාන සඳහා සුදුසුය.
- නම්‍යශිලි, අනම්‍යශීලිභාවය.
- අධ්‍යාත්මික හා ලෞකිකවාදය සඳහා මග පෙන්වීම.
- අද්විතීය සාක්ෂි තිබීම.
- සමාජීය ආගමිකි.

**(වෙනි විශේෂ අංග හතරක් සඳහන් කර ඇත්නම් ¼ x 4 = 1 ලකුණුක් ද, විග්‍ර කර ඇත්නම් 1 x 4 = 4 ක් ද ලබා දෙන්න.)**

(iii) ඉස්ලාමීය පදනම් මූලාශ්‍රයන් සඳහන් කොට එයින් **එකක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)

1. අල් කුර්ආන්
2. අස්-සුන්නා

- අල්-කුර්ආන්
  විග්‍රහය :- අල්ලාහ්ගෙන් ජිබ්රයිල් (අලෛ) මගින් මුහම්මද් නබි (සල්) තුමාට මිනිස් සමාජය යහමගට යොමු කිරීම සඳහා ලබා දුන් අවසන් දේව ග්‍රන්ථය.
- මූලාශ්‍ර යනු අල්කුර්ආන්, සුන්නා සාක්ෂි
- මෙය අල්ලාහ්ගේ අවසන් දේව ග්‍රන්ථයයි
- පරිපූර්ණත්වය
- අවසන් දිනය දක්වා ආරක්ෂිතයි
- සියලු විෂයන් අන්තර්ගත වේ. ඇතුළත් වේ.
- සැහැල්ලු භාවය
- දැනුමේ උල්පත
- කීකරු සමාජයක් හා උසස් ශිෂ්ටාචාර ගොඩ නැගීම සඳහා අවශ්‍ය උපදෙස් අන්තර්ගත වූ ග්‍රන්ථයයි
- මිනිස් උපමාරුවලට යටත් නොවී කිසිදු වෙනස් වීමකින් තොර ආරක්ෂා වූ එකම දේව ග්‍රන්ථයයි.
- විද්‍යාව, භාෂාව, නීති, ඉතිහාසය අනාවැකි යනු හාස්කම් ඇතුලත් වේ.
- අල්කුර්ආන් මිනිසාගෙන් බොහෝ යුතුකම් බලාපොරොත්තු වීම

(මෙවැනි කරුණු පහක් සඳහන් කර ඇත්නම් ලකුණු **1x5** = ලකුණු 05)

**1+5** = ලකුණු 06)

අස්සුන්නා දෙවැනි පදනම් මූලාශ්‍රය :

- අස්සුන්නා පද විග්‍රහය හා විග්‍රහය (ලකුණු 01 යි)
- සුන්නා මූලාශ්‍රය බවට සාක්ෂින්
- දෙවැනි මූලාශ්‍රයයි
- අල්කුරාන්, අස්සුන්නාව පිළිපැදිය යුතුයි යනුවෙන් පැවසීය ඇත.
- අල්කුරාන්ට විග්‍රහය ලෙස අස්සුන්නා තිබීම
- ඉජ්තිහාද් කිරීමේදී අස්සුන්නාගේ අවශ්‍යතාවය
- අල්කුරාන් වගේ අස්සුන්නා ආරක්ෂා කර තිබීම

(මෙවැනි කරුණු පහක් සඳහන් කර ඇත්නම් ලකුණු **1x5** = ලකුණු 05)

**1+5** = ලකුණු 06)

(iv) රිසාලත්, හිදායත් ලබාගැනීමේ මාධ්‍යයක් වන බව නබිවරුන්ගේ ඉතිහාසය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

- රිසාලත්, හිදායත් අර්ථකථනය
- රිසාලත් ලියුම්, පණිවිඩ යනු අර්ථකථනය වේ.
- ඉස්ලාමීය පරිභාෂාමය තේරුම : රිසාලත් යනු, තෝරාගත් නබිවරුන්ට අල්ලාහ්ගෙන් ලබා දුන් මෙහෙවර වේ.
- හිදායත් යනු පදය, ඍජු මාර්ගය ලෙස අර්ථකථනය වේ.
  ඉස්ලාමීය පරිභාෂාමය තේරුම වන්නේ මිනිසා මැවීමේ අරමුණ වටහාගෙන මෙලොව, පරලොව යනු දෙලොවෙහිම ඔහු ජය ලබා ගැනීම සඳහා වූ සාර්ථකත්වයේ මාවතේ ඔහුව යොමු කරන මගපෙන්වීම් යනු වේ.
  (මෙවැනි විග්‍රහයට ලකුණු 02 ක්)
- අල්ලාහ්, මිනිසාට තමාගේ සංජානන දැනුම, නිරීක්ෂණය, අත්හදා බැලීම්, තාර්කික මගින් හිදායත් ලබා ගත නොහැකි බව තහවුරු කිරීම සඳහා කාලයෙන් කාලයට නබිවරුන් හා රසූල්වරුන් යවන ලදී
- මිනිසුන් නොදැනුවත්කමේ ගිලී අල්ලාහ් දෙවියන් වහන්සේව මුළුමනින්ම අමතක වී සිටින විට රිසාලත් යනු වගකීම් භාර දූතයන් යවන ලදී
- අදම් (අලෛ) තුමාට පසු, දළ වශයෙන් අවුරුදු දාහකට (1000) පසු මිනිසුන් මුළුනින්ම අල්ලාහ්ව අමතක වී, ඔහුට වෙන දේ සමාන කරමින් ජීවත් වූ විට ඔහුත් අතර රිසාලත් මෙහෙවර ඉටු කිරීම සඳහා නූහ් (අලෛ) යවන ලදී.
- ඉන්පසු එතුමාගේ උපදෙස් සම්පූර්ණයෙන්ම නැති වීමෙන් පසු අල්ලාහ් විසින් ඉබ්‍රාහිම් (අලෛ) තුමා යවන ලදී
- මෙවැනි ඉස්මායිල් (අලෛ), ඉස්හාක් (අලෛ) තුමාද, ඉබ්‍රාහිම් (අලෛ) තුමාට පසු දළ වශයෙන් අවුරුදු දාහකට පසු ෆිර්අව්න් නම් දරුණු පාලකයා තමාගේ බලය අයුතු ලෙස භාවිතා කරමින් මිනිසුන්ට පීඩනය ලබා දෙමින් සිටි අවස්ථාවේ අල්ලාහ් විසින් එය තුරන් කිරීම සඳහා මූසා (අලෛ) තුමා රිසාලත් මෙහෙවර සඳහා තෝරා ගනු ලැබේ.
- මේ මෙහෙවර මාලාවේ ක්‍රි.ව. 7 වැනි සියවසසේ ආරම්භයේ දී මුළු ලොවම අසත්‍යයේ ගිලී අල්ලාහ් දෙවියන් වහන්සේව අමතක වී සිටි අවස්ථාවේ ඔවු මෙතෙක් කිසිම නබිවරයෙක් නො ආ ඉසමාලේ (අලෛ) තුමාගේ පරම්පරාවේ රිසාලත් යනු දේව මෙහෙවර අවසන් කිරීමටත් සියලු මිනිස් සමාජයට පොදුවෙන් මුහම්මද් නබි (සල්) තුමාව, අවසන් දූතයා ලෙසත්, අවසන් නබිවරයා ලෙසත් යවන ලදී.
- මුහම්මද් නබි (සල්) තුමා අවසන් දූතයා යනු එතුමාගේ සම්ප්‍රාර්ථිය ගෙන පෙර දේව ග්‍රන්ථවල සඳහන් වී ඇත.
- මෙවැනි මිනිසුන් යහමග පෙන්වීම අවශ්‍ය වූ විට රිසාලත් එය මෙහෙවර හා සහභාගිත්වය ලා දී ඇත.

(මෙවැනි අවම වශයෙන් නබිවරුන් 03 දෙනෙකුගේ ඉතිහාසය ඇසුරින් ලියා ඇතන්ම්)

**3 x 2** = ලකුණු 06 ක් , **2 + 6** = ලකුණු 08 කි)

**2 +4+6+8** = ලකුණු 20 කි)

**2.** (i) ඉජ්තිහාද්වලට අල්-කුර්ආන්හි සඳහන් කර ඇති මූලාශ්‍රයන්ගෙන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි.)

ඉජ්තිහාද්වලට අල්කුර්ආන්හි සඳහන් වූ සාක්ෂිත්

"ඔවුන්ගේ කරුණු තමන් තුළ සාකච්ඡා කිරීම ලෙස පවතී."- 42:38

"තවද බිය ද, ආරක්ෂාව පිළිබඳ පුවත ඔවුනට ලැබේ නම් එසැනින් ඔවුන් එය ප්‍රචාරය කරයි. ඔවුන් එය දූතයානන්ගේ නිලධාරි වෙත දන්වුවහොත් ඔවුන් අතරින් එය අනුමාන කර සිතිය හැකිය. එය විචක්ෂණශීලීව දැනගනී "- 4:83

"ඔබ අල්ලාහ්ට අවනත වී, එසේම ඔහුගේ දූතයාණන්ට අවනත වන්න, තවද ඔබ අතරෙන් (අල්ලාහ් හා දූතයන්ට අවනත වන) නායකවරුන්ට ද අවනත වන්න. "- 4:59

(ii) පරස්පර අදහස් තිබෙන විටක දී රැකගත යුතු, ඉස්ලාම් අවධාරණය කර ඇති පිළිවෙත් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

- සම්මුතියේ ගැටළු සඳහා සහයෝගිතාවය
- මතභේදාත්මක කරුණුවලදී ඉවසිලිමත් වීම.
- එකිනෙක අත් දිගු නොකර ගරු කිරීම
- එක් මද්හබ් හෝ තනි පුද්ගලයෙකුගේ මතයේ හිතුවක්කාරත්වයෙන් වැළකීම.
- අන් අය පිලිබඳව යහපත් ආකල්පය තබා ගැනීම
- තර්ක කිරීමෙන් හැකි තරම් වැළකීම
- ආගමෙහි මධ්‍යස්ථභාවය තබා ගැනීම
- පාරිභාෂිතයේ සංකල්ප දැනගනිමින් භාවිත කිරීම
- ඉජ්තිහාද් කරුණු ස්ථිරව කීමෙන් වැලකී සිටීම

(iii) 'කෞලුස් සහාබි' යන්න පැහැදිලි කොට, එය නීති මූලාශ්‍රයක් ලෙස පිළිගැනීමට සාධාරණ හේතු **දෙකක්** හා ප්‍රතික්ෂේප කිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

"කෞල්" යනු පදය අදහස් (ප්‍රකාශ)ලෙස අර්ථකථනය වේ.
පරිභාෂාමය තේරුම සහාබිවරුන්ගේ අදහස් යනුවෙන් අදහස් වේ.

සහාබිවරුන් නබි (සල්) තුමාට ඉතා සමීපව සිටිහ. ඔවුන් වහී පහලවීම නිරීක්ෂණය කළ තැනැත්තන්ය. නබි (සල්) තුමා නිතී පනවන විට එය අනුගමනය කළ අය නිසා සහබාවරුන්ගේ අදහස් හා ජීවිතය මූලාශ්‍රයක් ලෙස සඳහන් කළ හැක.
- නීති මූලාශ්‍ර ලෙස පිලිගැනීමට අවශ්‍ය හේතු,

- සහබාවරුන් නබිතුමාට ඉතා සමීපයි. එතුමාව අනුගමනය කරමින්. වහි පහලවීම නිරීක්ෂණය කළ සමාජය නිසා ඔවුන්ගේ අදහස් මූලාශ්‍ර ලෙස ලබා ගත හැක.
- සහබාවරුන්ගේ අදහස් සමහර අවස්ථාවල සුන්නා ද වේ.

- සහාබාවරුන් විශිෂ්ට සමාජය ලෙස නබි (සල්) විසින් ප්‍රසංසා කිරීම
- සහාබිවරයෙක් ඉදිරිපත් කළ අදහස් සමාජ ගත වූ පසු එය කවුරුන් ප්‍රතික්ෂෙප නොකලහොත් එය ඉජ්මා සූකූති වේ.
- සමහර අල්කුර්ආන් වැකි තබ්බවදන් (හදිසි) සහබාවරුන්ගේ උසස්බාවය කියා සිටීම

කෞලුස් සහාබි මූලාශ්‍ර ලෙස ප්‍රතික්ෂේප කිරීම හේතුන් :

- සහාබාවරුන් වැරදි කිරීමෙන් නිදෝස් වූ මඃසූම්වරු නොවෙති.
- සමහර අවස්ථාවල සහබාවරුන් තමන්ගේ වැරදි පිළිගෙන ඇත.
- සමහර අවස්ථාවල සහබාවරුන් තාබියින්වරුන්ගේ අදහස් ද පිළිගෙන ඇත.
- සහබාවරුන් ගෙන සඳහන් වූ නබි වදන් ඔවුන්ගේ උසස් තත්ත්වය ගෙන කියන මිසත් ඔවුන් දොෂවලින් ආරක්ෂා වූ අය යනු අදහස් නොකරයි.
  (විග්‍රහය සඳහා ලකුණු 02 ක් ද, පිළිගත හැකි න්‍යායන් සඳහා ලකුණු 02 ක් ද ප්‍රතික්ශේප කිරීමට ලකුණු 02 ක් ද, එකතුව ලකුණු 06 ක් ද වේ.)

(iv) මුස්ලිම්වරයකුගේ ගෘහ ජීවිතය, ගෘහයේ භෞතික පිහිටීම හා භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමීක මගපෙන්වීම්වලින් **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08 යි.)

ගෘහ ජිවිතය දළ විශ්ලේෂණය

- මුස්ලිම්වරයෙකුගේ නිවස ජීවිතය අරමුණ ලබා ගැනීමේ මූලික අඩවිය ලෙස තිබිය යුතුය
- නිවස තුළ සැනසීම, ආරක්ෂාව, සමාදානය, ආදරය තිබිය යුතුය.
- හොඳ ක්‍රියාවල් හා හොඳ ගතිගුණ තිබිය යුතුය
- සමාජයට අවශ්‍ය හොඳ පුරවැසියන් බිහි කිරීමේ කේන්ද්‍රමය ස්ථානය විය යුතුය.
- උගත් සමාජ සේවකයන් බිහි කරන ස්ථානය ලෙස තිබිය යුතුය.
- ඊමාන් මුල්කර ගත් හැගීම් ඉස්ලාම් ක්‍රියාකාරිත්වයයෙන් යුතු පවුල් සාමාජිකයන් එහි ජිවත් විය යුතුය.
- නිවසේ සිටන සෑමදෙනාම තම තමන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් නිසි ලෙස ලබා ගන්නා තැනක් විය යුතුය.
- නිවසක් තුළ අනුමනය කල යුතු නියායන් පවත්වාගත යුතුය.

භෞතික පිහිටිම හා භෞතික පරිසරය,

- ඉස්ලාම්, නිවසක් පහසුකමින් අවශ්‍ය ප්‍රමාණයෙන් අලංකාරයෙන් පවත්වා ගැනීමට අවසර දී ඇත.
- ඉස්ලාමීය සංස්කෘතියට අනුව නිවස සාදා ගත යුතුය.
- නිවසේ ඇතුල්, පිට පරිසරය පිරිසිදුව පවත්වා ගත යුතුය.
- නිවස අලංකාර කිරීමෙහි විධිමත් පරිදි භාවිතා කිරීමේ දී අවධානය යොමු කිරීම
- නිවසේ පිට පරිසරය ලස්සන හා අලංකාරයෙන් තබා ගැනීම
- නිවස ඇතුලේ තිබෙන අලංකාර මෝස්තර හා ගෘහ භාණ්ඩ ඉස්ලාමිය සීමාවලට අනුව තිබිය යුතුය.

(මෙවැනි කරුණු හතරක් විග්‍ර කර ලියා ඇත්නම් **4 x 2 =** ලකුණු 08 යි)

**3.** (i) 'ඉබාදත්' යනු කුමක් ද? (ලකුණු 02 යි.)

- "අබද" "උබූදියියා" යන මූලික පදවලින් විකසනය වී ඇත.
- යටත්වීම, සේවය කිරීම, නැමදීම, නමස්කාර කිරීම යනු අර්ථකථනය වේ.
- ඉස්ලාමීය පරිභාෂාමය තේරුම : "ඉබාදා යනු" ඉස්ලාම් ආගම විශ්වාස කරන තැනැත්තන් අල්ලාහ් දෙවියන් වහන්සේ මත තිබෙන උතුම් සෙනෙහස මුල් කොට ඔහුගේ දේව අනුශාසනා හා වැළකීම්වලට සම්පූර්ණයෙන් යටත් වී ජීවත් වීම වේ.

**(අර්ථකථනයට සඳහා ලකුණු 01 ලකුණක් ද, භාෂාමය තේරුම් සඳහා 01 ලකුණක් ද ලබා දෙන්න.)**

(ii) zසකාත් ලබාදෙන්නාට ලැබෙන ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

- ධනය භාවිත කිරීමේදී අල්ලාහ් දෙවියන්ට යටත්වීමට මග පෙන්වීම
- ලෝබකම ඉවත්වී, ත්‍යාගශීලීත්වයෙන් සිටීමට මග පෙන්වයි
- මනස හා ධනය පිරිසිදු කරයි
- නිසි ලෙස වියදම් කිරීමට පුහුණු කරයි.
- දුප්පත් අය සමඟ කරුණාවෙන් ක්‍රියා කිරීමට මඟ පෙන්වයි.
- අල්ලාහ්ගේ කරුණාව හා ආශිර්වාදය ලබා දෙයි
- ධනය වර්ධනය වීම
- පරලොවෙහි ස්වර්ගය ලබා දෙයි

**(කරුණු හතරක් කෙටියෙන් විස්තර කර ඇත්නම් 4 x 1 = ලකුණු 04 යි)**

(iii) හජ් හි අධ්‍යාත්මික හා ලෞකික ප්‍රයෝජන එකකට **තුන** බැගින් සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

අධ්‍යාත්මික ප්‍රයෝජන

- දේව බිය බැති භාවය ඇති වීම
- යටත්වීම, කැපවීම යනු හැගීම් වර්ධනය වීම
- පාප ක්‍රියාවලට සමාව ලැබීම
- පරලොව චින්තනය ඇති වීම
- දේව චින්තනයින් ජීවත් වීමට හැකි වීම
- ස්වර්ගය ලැබීම
- පාලනයෙන් ජීවත්වීමට හැකි වීම

ලෞකීක ප්‍රයෝජන

- ලෞකීය මුස්ලිම් ජනයන් අතර තමාද සිටිමේ හැඟීම්
- සහෝදරත්වය වර්ධනය වීම
- මුස්ලිම්වරුන්ගේ සුවිශේෂත්වය එළි දක්වීම
- සමාජීය ජීවිතයට පුහුණු කිරීම
- ජාත්‍යන්තර සමාදානයට මගපෙන්වීම
- ප්‍රශ්නවලදී ඉවසීමෙන් සිටිමට පුහුණු කිරීම

**(එක් එක් සඳහා කරුණු 03 ක් සඳහන් කර ඇත්නම් 6 x 1 = ලකුණු 06 යි)**

(iv) ඉස්ලාම් හි මූලික යුතුකම් හා අඛ්ලාක් අතර පවතින සබඳතාවය සාධක සහිතව විස්තර කරන්න. (ලකුණු 08 යි.)

- අඛ්ලාක් ඉස්ලාම් ධර්මයේ සෑම අංශවලටම බැඳී ඇති සාධකයකි. මෙම නිසා නබි (සල්) තමා ලෝවට යවන ලද අරමුණ මෙසේ පැහැදිලි කළහ.
- "නිත්‍ය වශයෙන් හොඳ ගති ගුණ සම්පූර්ණය කිරීම සඳහා මා නබිවරයෙක් ලෙස යවන ලදී."
- ඉස්ලාම් හි මූලික යුතුකම් වන සලාතය, උපවාසය, සකාතය, හජ් හා අඛ්ලාක් යනු සංස්කෘතිය අතර සම්බන්ධතාවයක් තිබේ. එය පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැක.

සාලාතය හා අඛ්ලාක්

- කෙනෙක් සලාතය නිවැරදිව ඉටු කළ විට ඔහුගෙන් හොඳ ගතිගුණ පහල වේ.
- දේවබිය, සිත පිරිසිදු වීම මෙයින් සිදුවන බැවින් හොඳ ගතිගුණ ඔහු තුළ වර්ධනය වෙමින් ඔහුව අවමන් සහගත හා පාපි ක්‍රියාවලින් ආරක්ෂා කරන්නේය.
- පිරිසිදුතාවය රකින සංස්කෘතිය ඔහු තුළ ඇති වීම
- වේලාවට වැඩ කිරීම පුරුදු කරයි
- හිත පාලනය කිරීම

  මෙවැනි ගතිගුණ සලාතය මගින් පහල වේ.

  සාක්ෂින් :-

  ඇත්තෙන්ම සලාතය අවමන් සහගත හා පිලිකුල් සහගත ක්‍රියාවලින් මිනිසා සුරතින්නේය. (29 : 45) (20 :14) (4 : 103)

සකාත් හා අඛ්ලාක්

- විශ්වයේ තිබෙන සම්පත් අල්ලාහ් සතුය. එම සම්පත් මිනිසා භාවිතා කරන්නේ කෙසේද පරීක්ෂා කිරීමට නියම කර ඇති යුතුකම සකාත් වේ. සකාතය නිසි ලෙස ඉටු කරන මිනිසා තුළ පහත සඳහන් ගති ගුණ ඇති වේ.
- ආදාරය, කරුණාව, උදව් උපකාර වීම වැනි ගති ගුණ ඇති වීම
- ලෝභකම, ලෝක ආශාව, අහංකාරය ඔහු තුළින් පිටත් වේ.
- දුප්පතාට කරුණාව දැක්වීම
- වියදම් කිරීමට පුහුණු කිරීම

  සාක්ෂින් :-
- "ඔවුන්ගේ දේපළවලින් සකාතය ගෙන, ඒ නිසා ඔවුනට අභ්‍යන්තරයෙන් හා බාහිර ලෙස පරිශුද්ධ කරනු මැනව." (9 : 103)

උපවාස හා අභිලාක්

- දේව බිය මුල් කරගෙන නියම වූ යුතුකමකි. මෙම උපවාසය මගින් පහත සඳහන් ගති ගුණ ඇති විය හැකිය.
- ඉවසීම,
- ත්‍යාගශීලීත්වය
- කරුණාව
- අවමන් සහගත හා පිලිකුල් ක්‍රියාවලින් පාලනය කිරීම

සාක්ෂි

- නොකා නොබී සිටීම උපවාස නොවන්නේය. උපවාස වන්නේ අවමන් සහගත හා පාපි ක්‍රියාවලින් ඈත්වී සිටිමය. ඔබ උපවාසයේ යෙදී සිටින විට කවරෙරක් ද ඔබ සමඟ තර්ක කරන විට ඔබ උපවාසයේ යෙදී සිටින බව පවසන්න.

- ඉබ්නු හුසෙයිමා -

<u>හජ් හා අල්ලාක්</u>

- නබී ඉබ්‍රහීම් (අලෛ) හා එතුමාගේ පවුලේ අය කළ පරිත්‍යාග සිහි කරන යුතුකමක් ලෙස මෙය හැඳින් වේ.
  මෙයින්
- විශ්වාසය
- එකමුතු, එක්සත්භාවයෙන් මනුෂ්‍යත්වය ඇති වීම
- ෂෙතාන්ට එරෙහිව සටන් කිරීම
- මනෝ ආශාව පාලනය කිරීම
- පරිත්‍යාගය
- කැපකිරීම
- ඉවසීම
- දේවශිර්වාදය වන ගතිගුණ ඇති වේ

සාක්ෂි

(ඉහ්රාම් ඇඳ) කවරෙකු හජ් යුතුකම තමාට බැඳී සිටී නම් "හජ්හි" (10 වෙනි දවස) දක්වා පවුල් ජීවිතය අසභ්‍ය වචන භාවිතා කිරීම, රණ්ඩු වීමෙන් වැලකී සිටින්න. - 2:137

## II කොටස

4. (i) ඉස්ලාම්හි ෂරීආ ගැන සඳහන් කොට, දීන් හා ෂරීආ අතර පවතින වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

භාෂාමය තේරුම :- පහදාදීම, ආරම්භය, ජල උල්පත, පැහැදිලි වීම
පැහැදිලි මාර්ගය

ඉස්ලාමීය පරිභාෂාව දෙආකාරයකට ඉදිරිපත් වේ.

1. විශේෂ අදහස :-
   ෂරීආ යනු විශ්වාසයේ සිද්ධාන්ත සහ ශිෂ්ටාචාරය හැරෙන්න මිනිස් ජීවිතය හා එදිනෙදා සම්බන්ධ වන ප්‍රායෝගික නීති වේ.
2. සාමාන්‍ය අදහස :-
   අල්ලාහ් විසින් මිනිසුන්ට පහල කළ නීති වේ. එම නිසා ෂරීආ යනු විශ්වාසයේ සිද්ධාතය, සංස්කෘතික හා නිතී අන්තර්ගත වූ දෙයකි.

**දීන් හා ෂරියා අතර තිබෙන වෙනස්කම**

- නබි(සල්) තුමා වෙත අවසන් ෂරිආව ලබා දී ඇත. එය ස්ථාවරව පවතී. පිරිසිදුය, අවසානය, දේවත්භාවය හා නම්‍යශීලි, අනම්‍ය ශීලි භාවය ඇති දෙයකි.
  මේ අනුව
- දීන් යන්න ස්ථාවරව පවති, ෂරිආ වෙනස් වේ.
- දීන් යනු අකිදාව සඳහන් කරයි. ෂරිආ යනු නීතිරීති සඳහන් කරයි.
- දීන් හි අඩුපාඩු සෙවීම ඉස්ලාම් ධර්මයෙන් ඈත් කරයි.
- ෂරිආ හි අඩුපාඩු සෙවීම ඊමාන් හි අඩුපාඩු ඇති කරයි.
- (දීන්) ආකිදාහි මතභේද ඇති කරන්නා ප්‍රතික්ෂේප කරන්නා ලෙස හැඳින්වේ. ෂරි ආ වෙහි එසේ නොවෙයි.
- ෂරිආ, ආදම් (අලෛ) පටන් මුහුමම්ද් (සල්) තුමා දක්වා වෙනස් වී පහල වුවත් මුහම්මද් (සල්) සමඟ එය අවසාන වූ එකකි. මින් පසු එය නොවෙනස් වේ.
- ෂරිආ හි සමහර තැන්වල ඉජ්තිහාද් කිරීමට අවස්ථාව තිබේ. නමුත් දීන් (අකීදා) හි ඉජ්තිහාද් කිරීමට ඉඩ නැත.
- ෂරිආ හි සමහර තැන්වල නම්‍යශීලිව ක්‍රියා කිරීමට ඉඩ ඇත. නමුත් දීන් හි එසේ නොමැත.

(වචන විග්‍රහය හා හඳුන්වාදීමට ලකුණු 04 ක් ද වෙනස්කම් 03 ක් විග්‍රහ කර ඇත්නම් **2 x 3 =** ලකුණු 06 ක් ද ලබා දෙනු)

(ii) විශ්වය, මිනිසා හා ජීවිතය පිළිබඳව ඉස්ලාමික දෘෂ්ටිකෝණය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

විශ්වය ගැන ඉස්ලාමික දෘෂ්ටිකෝණය

- විශ්වය යන්න අල්ලාහ් හා ඔහුගේ අර්ෂ් හැර මෙම විශ්වයෙහි තිබෙන සියලු මැවුම් සඳහන් වේ.

**විශ්වය ගැන පරිණාමවාදයේ න්‍යායන්**

- විශ්වය ඉබේම බිහිවී ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය වූවකි.
- ක්‍රි.ව 5 වැනි සියවසේ සිට ග්‍රීක විද්වතුන් මෙයට පුරෝගාමිකයෝ වෙති
- ක්‍රි.ව 15 වැනි සියවසේ යුරෝපයෙහි ඇති වූ විද්‍යාත්මක විප්ලවය මෙම න්‍යායන්වලින් වෙනස්කම් ඇති කරයි.
- ඩාර්වින් යන අයගේ චින්තය පුරෝගාමික වීම

**මැවුම් න්‍යාය**

- ආගමට ලැදී චින්තය ඉදිරිපත් වීම.
- මෙම චින්තනය අනුව මෙම විශ්වයේ තිබෙන එක් එක් දේ තනිතනියෙන් මවන ලද පරිනාමවාදයට කිසිදු සාක්ෂියක් නොමැත.

<u>ඉස්ලාමීය දෘෂ්ටිකෝණය</u>

- විශ්වයේ මැවුම්කරු අල්ලාහ්ය. අහස හා පොළොව ද පූර්වාදර්ශයක් නොමැතිව මැව්වේය.
- ඔහු දින හයකින් අහස හා පොළන මැව්වේය. දවල් හා රාත්‍රිය ද, ඉර හා හඳ ද ඔහු මැව්වේය.
- මේ සියල්ල මැව්වාට පසු සෑම මැවීම්වලටම නිර්නායක හා නීති ඇති කළේය.
- විශ්වයේ සියලු දේම තම සීමාව නොඉක්මවයි. සීමාව නොවරදවා යන ඉර ද තමන්ගේ නියමයෙන් ගමන් කරයි.
- ක්‍රිස්තියානි හා නවීණ විද්‍යාව විශ්වය අධ්‍යයනය කරන බලය ගැන විශ්වාස කරයි. ඉස්ලාම් එම බලය අල්ලාහ් ලෙස හඳුන්වා දෙයි.
- පොළොව හා විශ්වය අල්ලාහ්ගේ නියමය පරිදි විනාශ වේ.
- අල්ලාගේ යථාර්ථය තේරුම් ගැනීමට අපහසු වූ වත් ඔහුගේ මැවීම් අතරින් ඔහුගේ හැකියාව, නුවණත්භාවය පැහැදිලි වේ.
- එම නිසා අල්කුර්ආන් අල්ලාහ්ගේ මැවුම් ගෙන අවධානය යොමු කරන ලෙස පවසයි.

<u>මිනිසා ගැන ඉස්ලාමීය දෘෂ්ටිකෝනය</u>

- සැබැවින්ම (මුලදී පළමු) මිනිසා මැටිවල ශාරයෙන් අප මැව්වෙමු.
- මිනිසා අල්ලාහ් විසින් දැනුම ලබා දී මෙලොවට යවනු ලැබේ.
- මිනිසා උසස් මැවුමකි
- මිනිසාට ඍජු මාර්ගය පෙන්වීමමේ වගකීම අල්ලාහ් භාරගෙන ඇත.
- විශ්වයේ ඇති සම්පත් සියල්ල මිනිසා වෙනුවෙන් මවනු ලැබ ඇත.
- මිනිසා වගකීම් දරන්නෙකි. එයට වග කීමට ඔහු බැඳී සිටී.
- එබ සෑම දෙනාම රක බලා ගන්නය. ඔබ ඒ ගැන ප්‍රශ්න කරනු ලබන්නේය. (මුස්ලිම්)
- මිනිසා කිලාපත්, ඉබාදත්, ඉමාරක් ආදි කාර්යයන් ඉටු කළ යුතුය.

<u>ජීවිතය ගැන ඉස්ලාමීය දෘෂ්ටිකොණය</u>

- මිනිසාගේ උපත මරණය අතර තුර කාලයේ දී සිදුවෙන සියලු උතුම් ක්‍රියාකාරකම් ජීවිතය වන්නේ
- විශ්වය මිනිසා මවා ඇති බැවින් ඔහු එය වටහාගෙන භාවිත කළ යුතුය.
- ලෞකික ජීවිතය සමතුලිතව සකස් කර යුතුය
- මෙලොව පරිණත මධ්‍යස්ථානයකි
- මෙලොව ජීවිතය පරලොව ජීවිතයට අදාළ වගා බිමිකි.

(අංශ 03 ම සඳහන් වන පරිදි කරුනු 10 ක් ඉස්ලාමීය දෘෂ්ටි කොනයෙන් විග්‍රහ කර ඇත්නම් **1 x 10 =** ලකුණු 10 ක් ලබා දෙන්න)

**5.** (i) ඉස්ලාම් අනුමත කළ වෙළඳ ක්‍රම **හතරක්** ගැන සඳහන් කොට, වෙළඳාම සඳහා වූ කොන්දේසි විස්තර කරන්න. (ලකුණු 10 යි.)

01 - මුෂාරකා

- දෙදෙනකු හෝ වැඩි පිරිසක් හවුල් වී එකිනෙකාගේ ප්‍රාග්ධනය එකතු කොට, යම්කිසි නිෂ්පාදනයක හෝ ව්‍යාපාරයක හවුල්කරුවන් ලෙස කටයුතු කිරීමේ ක්‍රියාවලියකි.
- ලාභ, අලාභ, ඔවුනොවුන්ගේ ප්‍රාග්ධනයට අනුව බැදී යයි.

02- මුලාරබා

- එක් පාර්ශවයකගේ ප්‍රාග්ධනයත් තවත් පාර්ශවයකගේ ශ්‍රමයත් පදනම් කොට, ක්‍රියාත්මක වන ව්‍යාපාරික කටයුත්තෙන් ලැබෙන ලාබය, දෙපාර්ශය අතර අනුපාත ක්‍රමයට බෙදා ගන්නා ආකාරයට සිදුවන එක්තරා හවුල් ව්‍යාපාරයකි.
- ඉස්ලාමිය විද්වතුන් මෙම ක්‍රමයට අනුමතය දී ඇත.
- ජාහිලියා කාලයේදිම ප්‍රසිද්ධ ව්‍යාපාර ක්‍රමයක් වේ.

3- මුරාබහා

- ''රබ්හ'' යන මුල් පදයෙන් බිඳ ආ පදයකි.
- ව්‍යාපාරිකයෙකු තම විකුණුම් භාණ්ඩයේ ගැනුම් මිල පාරිභෝගිකයාහට පවසා, එම භාණ්ඩය විකිණිම ''මුරාබහා'' වේ.
- මෙහි ගැනුම් මිල හා ලාබය ගැන පාරිභෝගිකයා දැන්වත් වේ.
- සාමාන්‍ය විකිණිම්වලදි ව්‍යාපාරිකයා ගැනුම් මිල ගැන නොපවසන නිසා මෙම ක්‍රමය වෙනත් ස්වරූපයක් ගනි.

4- මුසාරආ

- මෙය හවුල් කෘෂිකර්මාන්තය ලෙස හැදින්වේ.
- පුද්ගලයෙකු තමාට අයිති ඉඩම වෙනත් කෙනෙකු සමඟ එකතු වී, නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා එම ඉඩම භාවිතා කිරිම මුසාරආ වේ.
- තමාට අයිති ඉඩම වෙනත් කෙනෙකුට වගා කිරීම සඳහා ලබා දී ගිවිසුමක් මගින් අස්වැන්නෙන් බාගයකක් හෝ කොටසක් ලබා ගැනිමට ඉස්ලාම් අනුමත කරයි.
- නමුත් මුහම්මද් (සල්) මෙයින් එක් ස්වරූපයක් තහනම් කර ඇත. ඉඩම් අයිතිකරු වගා කරන්නාට නිශ්චිත අස්වැන්නක් තමාට ලබා දෙන ලෙස හෝ ඉඩමෙහි නිශ්චිත කොටසක අස්වැන්න තමාට ලබා දෙන ලෙස හෝ කොන්දේසි පැනවීම තහනම් කොට ඇත.

5- සලම් (පෙරගෙවුම් ක්‍රමය)

- මුදල් ලබා ප්‍රමාද වී භාණ්ඩය භාර දීමේ ක්‍රමය
- භාණ්ඩයේ මුළු මුදලම පාරිභෝගිකයා ලබා දෙන අතර විකුණුම්කරු එම භාණ්ඩය නිශ්චිත දිනයකදී බාර කරයි.
- මෙය අල්කුර්ආන්, සුන්නා හා ඉජ්මා යටතේ අනුමත ක්‍රමයෙකි.
- මුදල් ඇත්තාට භාණ්ඩය අවශ්‍ය වී තිබිය හැක. නිෂ්පාදනය කරන්නාට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීමට පෙර හෝ අස්වැන්න නෙලීමට පෙර මුදල් අවශ්‍යතාවකින් පසුවිය හැක. දෙදෙනාම එක්තැන් කරන ක්‍රියාවලිය ලෙස මෙය හැඳින්වේ.

6- බෛඋල් මුඅජ්ජල් හෝ බෛඋත් තක්සීත්

- වාරික පදනමින් සිදුවෙන ව්‍යාපාර ක්‍රමය වේ.
- මෙම ව්‍යාපාර ගිවිසුමේදී භාණ්ඩ පෙරත් ඊට අදාල මුදල පසුවත් ගෙවනු ලැබේ.
- මෙම ව්‍යාපාරයේදී පාර්ශව තුනක් සම්බන්ධ වේ. එ විකුණුම්කරු ගැනුම්කරු හා තැරව්කරු වේ.
- මෙහිදී භාණ්ඩයේ මිල සාමාන්‍යයෙන් වෙළඳපොළේ මිලට වඩා වැඩියෙන් පවති.
  මෙම ව්‍යාපාර ක්‍රමය මද්හබ් හතරෙහි බහුතර විද්වතුන්ගේ මතයට අනුව අනුමත ව්‍යාපර ක්‍රමයකි.

<u>ව්‍යාපාර සඳහා වූ කොන්දේසි</u>

- ඉස්ලාමීය දෘෂ්ටිකොණයේ ව්‍යාපාර යනු ගැනුම්කරු හා විකුණුම්කරු යන දෙපාර්ශවයේ ම ස්වකැමැත්ත පරිදි සිදුවන භාන්ඩ හුවමාරුව වේ.
  හෝ අනුමත කරන ලද අයුරින් කෙනෙකු වටිනාකම ලබා තමාට අයත් යමක් තව කෙනෙතකුට භාරදීම වේ.

1. විකුණුම්කරු හා ගැනුම්කරු
   - සිහිබුද්ධිය ඇත්තෙකු වීම
   - වැඩිහිටියට පත්ව සිටිම
   - ව්‍යාපාරය පිළිබඳ අවබෝධය ඇත්තකු වීම

2. ව්‍යාපාර භාණ්ඩය
   - මිලදී ගන්නාට බාර කල හැකි තත්තවයේ තිබීම
   - විකුණන්නාට අයිති ව තිබිය යුතුය
   - විකුණුම්කරු යටතේ තිබීම
   - ඉස්ලාමයට අනුව පිරිසිදු හා ප්‍රයෝජනවත් එකක් වීම

3. ඊජාබ් - කබූල්
   - ඊජාබ් - බාරදීම
   - කබූල් - බාර ගැනීම
   - මෙය වාචිකව හෝ ලිඛිතව හෝ භාවිතයේ ඇති වෙනත් ක්‍රමයකින් හෝ සිදුවිය හැක.

(මෙවැනි ව්‍යාපාර ක්‍රමයන් හතරක් සඳහන් කර ඇත්නම් 1 x 4 = ලකුණු 04 ක් ද ව්‍යාපාරයේ කොන්දේසි විග්‍රහ කර ඇත්නම් 3 x 2 = ලකුණු 06 ක් ද ලබා දෙන්න.)

(ii) කර්මාන්තවලට ඉස්ලාම්හි ලබා දී ඇති වැදගත්කම නබිවරුන්ගේ ඉතිහාසය හා සම්බන්ධ කර විස්තර කරන්න. (ලකුණු 10 යි.)

කර්මාන්තවල වැදගත්කම

- මිනිස් අවශ්‍යතා අතුරින් බොහෝ දෑ යකඩ හා සම්බන්ධ වේ. වාහන, නිවස, ගොඩනැගිලි හා තවත් බොහෝ දෑ සඳහන් කළ හැකිය.
- කර්මාන්තයට යකඩ අත්‍යවශ්‍ය වේ. අල්කුර්ආන්හි යකඩ යන අදහස දෙන අල් හදීද් යන නමින් පරිච්ඡේදයක් ද අන්තර්ගතය.
- දේව දූතවරු බොහෝ දෙනෙක් ප්‍රධාන කර්මාන්තවල නිරත වී ඇත්තෝය.
- නබි දාවූද් (අලෛ) තුමා, අයුධ නිෂ්පාදනයේ නියැලී සිටියෝය. යකඩ භාවිත කළ යුතු තාක්ෂණ අල්ලාහ් එතුමාණන්ට ලබා දුන්නේය. තවද එමගින් කුමන වර්ගයේ ආයුධ නිෂ්පාදන කළ යුතු ද යන්න පිළිබඳ ද අල්ලාහ් එතුමාට ඉගැන් වූ බව අල්කුරාන්හි සඳහන් වේ.
- නූහ් (අලෛ) තුමාට නැව් නිෂ්පාදනය සඳහා වන දැනුම හා උපාය මාර්ග පිළිබඳ අල්ලාහ් ඉගැන්වූහ.
- සකරියියා (අලෛ) වඩුවැඩ කටයුතුවල ද නිරත වී සිටියෝය.
- කර්මාන්තය අන් අයට ඉගැන්වීම ද සුන්නා ලෙස හා යහපත් ඉබාදතයෙක් ලෙස පත් කොට ඇත.
  "ඔබට දන්නා කර්මාන්තයක් ඉගැන්වීම ඔබව නිරයෙන් ආරක්ෂා කරයි." (අල්-හදීන්)

**(හැඳින්වීම හා වැදගත්කමට ලකුණු 04 ක් ද, නබිවරු තුන් දෙනෙකු සම්බන්ධ කර ලියා ඇත්නම් ලකුණු 06 ක් ද, මුළුමනින් ලකුණු 10 ක් ද ලබා දෙන්න)**

**6.** (i) සුබසාධනය පවත්වාගැනීම පිළිබඳ ඉස්ලාමීය මතය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

- සුභසාධනය පවත්වා ගැනීම මුස්ලිම්වරයෙකු සතු තිබිය යුතු ලක්ෂණයකි.
- මුස්ලිම්වරයෙකු ආත්මාර්ථකාමියකු ලෙස නොසිටි යුතුය.
- එක් මුස්ලිම්වරයෙකු සුභ සාධනවල නියැලීම ඉබාදද් වේ. තව ද එය දන්දීමට සමානය.
  "යහ ක්‍රියාකාරකම් සියල්ලම සදකාවක් වැනිය." (අල්-හදීස්)
  "මිනිසුන්ගෙන් ශ්‍රේෂ්ඨයා වන්නේ මිනිසුන් හට අඩිකව උපකාර කරන්නාය"
  - අල් - හදීස්
- ඉස්ලාමීය ෂරියාවේ එක් ඉලක්කයක් ලෙස මිනිසාට යහපත සැලසීම දැක්විය හැකිය.
- ජනතාවගේ අත්‍යවශ්‍ය අවශ්‍යතාවයන් හා සාමාන්‍ය අවශ්‍යතාවයන් ඉටු කිරීම මගින් ජනතාවගේ යහපත් අවශ්‍යතාවයන් සම්පූර්ණ විය යුතු යැයි ෂරියාව සඳහන් කරන්නේය.
- රටේ ඇති වන්නා වූ ආපදා අවස්ථාවනන්හි ජාතිය, වර්ණය, භාෂාව, දහම යනාදිය පසෙක ලා යහපත පිණිස උදව් වීම අපගේ වගකීමකි.
- පොදු යහපත පිණිස මත්ද්‍රව්‍ය වැලැක්වීම, ඩෙංගු මර්ධනය කටයුතු, ශ්‍රමදාන, ලේ දන් දීම යනාදි වැඩ කටයුතු කවරෙකු කළ ද ජාති ආගම් භේදයෙන් තොරව උදව් කළ යුතුය.

(මෙවැනි කරුණු 05 ක් පැහැදිලි කර ඇත්නම් **5 x 2 =** ලකුණු 10 කි)

(ii) ඉස්ලාම් ලබා දී ඇති ස්ත්‍රී පුරුෂ සමානතාවයෙහි ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට ගෙන ඇති ක්‍රමවේද **පහක්** විස්තර කරන්න. (ලකුණු 10 යි.)

- ඉස්ලාම්, කාන්තාවන්ව සමාජයේ පිරිමින්ට සමානව සැලකේ.
- ඉස්ලාම්හි පැමිණීමට පෙර බොහෝ සමාජයන් කාන්තාවන්ව ප්‍රතික්ශේප කරද්දී ඉස්ලාම් ඔවුන්ව අභිමානවත් කරති.
- ඉස්ලාම් කාන්තාවන්ගේ අයිතිවාසිකම් රැක ගැනීම සඳහා ආරක්ෂා දී ඇත.
- පිරිමි හා කාන්තාවන් යන දෙපාර්ශවයම එකම ස්ථානයහි බිහිවිය. මනුෂයෙකු ලෙසත් වගකීම් දරන්නෙකු ලෙසත් කුසල් ලබා ගැණීම අතින් දෙපාර්ශවයේම සමාන ස්ථාන හිමි කර ගනියි.
- ධර්මයේ සම අයිතිය.
- සමාජ වගකීම්වල සම අයිතීන්. (කාන්තාවන් පාපයන්හි මූල බීජය හා අයහපතේ ආරම්භය යනු මතයන් ඉස්ලාම් තරයේ හෙළා දකී)
- කාන්තාවන්ගේ අයිතිවාසිකම් රැකගැනීම සඳහා ඉස්ලාම් පහත සඳහන් අයිතිවාසිකම් ලබා දී ඇත.
- එකම ආත්මයකින් බිහි වූ පිරිස

ඔහු ඔබ සියල්ලන්වම එකම ආත්මයකින් උත්පාදනය කළේය. ඔහුගෙන් ඔහුගේ බිරිඳ උත්පාදනය කළේය. පසුව ඒ දෙදෙනාගෙන් බොහෝ පිරිමි ගැහැණු නිකුත් කර විසිර යාමට සැලැස්සුවේය.

(4:1)

- ධර්මය හා එහි විග්‍රහය පිළිබඳ සම අයිතිය.

" නියතවූ මුස්ලිම්වරුන්වන පිරිමින්ට ද ගැහැනුන්ට ද, විශ්වාසවන්තයින් වන ගැහැණුන්ට ද, පිරිමින්ට ද ...... "අල්ලාහ් ඉමහත් කුලියක් පිලියෙල කර ඇත්තේය. (33 :35)

- සමාජ වගකීම්වල සම අයිතීන්

" විශ්වාසවන්තයින් පිරිමින්ට ගැහැණුන් ද ඔවුන්ගේ සමහරු තවත් සමහරුන්ට උදව් කරන මිතුරන් වෙති. ඔවුහු යහපත අණ කරති. අයහපතෙන් වලක්වති (9 :71)

- කුසල් ලබා ගැනීමෙනුත් ස්වර්ගය ලබා ගැනීමනුත් සම අයිතිය.

" නුඹලාගෙන් පිරිමින් හෝ ගැහැනුන් හෝ වේවා යහපතක් කරන විට මම එය අපතේ නොයවන්නේමි. (3:95)

- ඉස්ලාමය අධ්‍යයනය කිරීම හා ශිල්ප ඥානය ලබා ගැනීම
- දැනුම සෙවීම සෑම මුස්ලිම් පිරිමින්, ගැහැණුන්ට අනිවාර්ය වගකීමකි. - (බුහාරි)
- ශිවිසුම් ගැනීම, ආයෝජනය කිරීම,ඉපයීම, ඉපයිමෙන් ලබා ගන්නා දේ තමන් සතුව තබා ගැනීමේ අයිතිය.
- මිනිස් සමාජය වර්ධනය කිරීම

(මෙවැනි කරුණු 05 ක් විග්‍රා කර ඇත්නම් **5 x 2 =** ලකුණු 10 කි)

**7.** (i) 'අල්-ඉල්හාද්' යන්න අර්ථ දක්වා එහි බිහිවීම, වර්ධනය හා ඉස්ලාම් ලෝකයට එයින් ඇති වූ බලපෑම් ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

භාෂාමය : ලත්දුන් වන පදයෙන් විකසනය වී ඇත. අරමුණින් හැරීම

පාරිශුද්ධත්වය නැතිකිරීම, ආගම බොරු කිරීම වැනි අදහස් දෙන්නේය.

ඉස්ලාමීය භාෂාමය :

මෙම විශ්වයේ දෙවියන් හා ආගම මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම

මෙවැනි සිද්ධාර්ථ තිබෙන අය මුල්හිද්, දහිරියියුත් යනුවෙන් හැඳින් වේ.

බිහිවීම හා වර්ධනය

- අදේව විශ්වාස සමහරු විසින් ඉතිහාසය පුරාම වර්ධනය කර ඇත.
- ඉස්ලාම් හඳුන්වාදුන් කාලය දීම අදේව විශ්වාසින් සිටිහ
  " ඔවුන් මෙය අපගේ ලෝක ජීවිතට හැර වෙනත් ජීවිතයක් නැත. අපි මැරෙන්නෙමු. තවද ජීවත්වෙමු. කාලය හැර වෙනත් කිසිවක් අප විනාශ කරන්නේ නැත " - (අල් -කුර්ආන්)
- පෙර දේවදූත පහල වූ කාලයේදීම මෙම අදේව විශ්වාසියන් සිටි බව අල්කුර්ආන් සඳහන් කරයි.
- මෙම සිද්ධාර්ථය යුරෝපියාවේ සැලසුම් සහගත ලෙස බිහිවිය.
- යුරෝපයේ විද්‍යාත්මක අදහස් ඉදිරිපත් කිරීමට එරෙහි වූ නිසා බුද්ධිමතුන් අතර අදේව විශ්වාසය දැඩි විය.
- උගත් යුරෝපියන් අදේව වාදය බුද්ධිමත් විශ්වාසයන් බව සැලකූහ.
- කර්මාන්ත විප්ලවය යුරෝපය පුරා අදේව වාදය පැතිරීමට පෙලඹවීමක් වූයේය.
- අදේව විශ්වාසය විඥාණමය පරිණාමය ලැබීමට ඩාවින්, බර්ටන් රසල්, ෆ්‍රොයිඩ්, කාර්ල් මාර්ක්ස් වැනි විඥාණවාදින් හේතු වූ හ. මොවුන් දැඩි ලෙස ආගම විවේචනය කළහ.
- ආගම අබින් හා සමාන යැයි කාර්ල් මාක්ස් කීය.
- ඔක්තෝබර් කැරැල්ලක් සමඟ සමාජවාදී පාලනයට හැරුණු රුසියාවේ අදේව වාදය පූර්ණ වශයෙන් ආගමට එරෙහි ආකල්ප ක්‍රියාත්මක විය.
- අදේව විශ්වාසයේ බලපෑමත් සමග ඇතිවූ අධ්‍යයනය ආර්ථික හා සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවල ඇති වූ දියුණුව ආගමික විශ්වාසයන් බොරු කරන ඒවායේ ප්‍රචාර ආදිය හේතුවෙන් 19 වැනි සියවසේ ආරම්භයත් සමඟ අදේව වාදය ලොව පුරා වේගයෙන් පැතිරෙන්නට විය.

පහත සඳහන් කරුණු අදේව වාදය වර්ධනය වීමට හේතු වශයෙන් දැක්විය හැකිය.

1. ආගම් අතර හා ආගම් තුළ පැවැති ගැටුම් හා විරුද්ධ හැඟීම්
2. ආගම්වල දක්නට තිබුණු මිත්‍යා විශ්වාසය
3. ආගම් විඥාණමය අදහස් හුවමාරුව වැළැක්වීම
4. ආගම් අන්ධ ලෙස විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රතික්ෂේප කිරීම
5. අදේව විශ්වාසයේ පැවැති අදහස්මය හා චර්යාමය නිදහස
6. අදේව පසුබිමේ ඇති වූ සංවර්ධනයන්

ඉස්ලාමිය ලෝකයේ අදේව වාදයත් ඇති වූ බලපෑම්

- සියෝනිස කුමන්ත්‍රණ හේතුවෙන් උස්මානිය කිලාෆන්ය බිඳවැටීමක් සමඟ අනාගමික යුරෝපි රටවල් ද අදේව සෝවියත් රුසියාව ද මුස්ලිම් රටවල තම චින්තනය ව්‍යාප්ත කිරීමට ගත් වෑයම නිසා මුස්ලිම් බහුතර රටවල් රැසක්ම ආගමික නොවන රටවල් බවටත්. තවත් සමහර මුස්ලිම් බහුතර රටවල් සමාජවාදය අනුගමනය කරන රටවල් බවටත් පත් විය.
- එයින් පසුව අදේව විශ්වාසයේ පදනම් කොට ඉස්ලාමිය අංගයන් සියල්ල විනාශ කිරීමට විවිධ වෑයම් ඒ රටවල සිදු විය
- මෙහි ප්‍රතිඵල ලෙස ඉස්ලාමීය ලොවේ නම් දරු ''තාහා හුසේන්, සලාමත් මූසා'' වැනි අදේව වාද මත ඇති විද්වතුන් බිහි විය.
- අදේව විශ්වාස මුස්ලිම්වරුන්ගේ ඊමානයට මහත් අභියෝගයක්ව පැවැති අතර එයින් ඉස්ලාම හා මුස්ලිම්වරු සුරකීමට "ජමාලුදීන් අෆ්කානි, මුහම්මදු අබ්දුහු, අල්ලාමා ඉක්බාල්" වැනි ඉස්ලාමීය විද්වතුන් දැඩි ලෙස වෑයම් කළහ.
- අදේව වාදයේ අභියෝගයන්ට පිළිතුරු දීම. මුස්ලීම් සමාජය දැනුමෙන් ගොඩ නැගීම යනාදී පරිමාණයන් දෙකෙන් සේවය කළහ.
- එහි ප්‍රතිඵල වශයෙන් අල්කුර්ආනය සඳහා නවීන විවරනයන් බිහි විය.
- තවද, මුස්ලිම් සමාජයට දැනුම පදනමින් මගපෙන්වන ඉස්ලාමීය සංවිධානය බිහි විය.

(ii) මුස්ලිම්වරයකුගේ දෛනික ක්‍රියාකාරකම්වල දී හුකූකුල්ලාහ්, හුකූකුල් ඉබාද් ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

විග්‍රාහය :-

- මිනිසා අල්ලාහ්ගේ ගැත්තා ලෙස ඔහු අල්ලාහ්ට කළ යුතු යුතුකම් ''හුකූකුල්ලාහ්'' වේ.
- අල්ලාහ්ට කළ යුතු යුතුකම්

අල්ලාහ්ව දෙවියන් ලෙස විශ්වාස කිරීම, ඔහුට නැමදීම, ඔහුගේ අස්මා හා සිෆාත් අනුව විශ්වාස කිරීම, ඔහුගේ අණ පිළිපැදීම හා ඔහුගේ දූතයා වන මුහම්මද් (සල්) තුමාව දූතයා ලෙස පිළිගැනීම.

(මෙයින් මිනිසා වැරදි කරන විට අල්ලාහ්ගෙන් පාපොච්චාරනය කිරීමෙන් සමාව ලබා ගත හැක)

(හුකූකුල්ලහ් ගැන විග්‍රහයට හා හඳුන්වාදීමට ලකුණු 02 ක් ද, අල්ලාහ්ට ඉටු කළ යුතු යුතු කම් විග්‍ර කර ඇත්නම් ලකුනු 02 ක් ද මුළු ලකුණු 04 ක් )

හුකූකුල් ඉබාද්

විග්‍රහය

- මිනිසා තමාට හා සමාජයට ඉටු කළ යුතු යුතුකම් වේ.

උදාහරණ :

මිනිසා තමාට කළ යුතු යුතුකම් :

01. ගැලපෙන ආහාර අවශ්‍ය ප්‍රමාණයට අනුභව කිරීම
02. ශාරීරික හා ගරුත්වය රැක ගැනීම
03. ශාරීරික හා මානසික විවේකය ලබා දීම
04. පිරිසිදුව සිටීම
05. සුව ජීවිතයට ශරීරක අධ්‍යාන කිරීම
06. රෝගි අවස්ථාවේ ප්‍රතිකාර ලබා ගැනීම
07. දුක්, කම්මැලිකම, අබාධිත වැනි දේවලින් ආරක්ෂා වීම

<u>මිනිසා තවත් මිනිසෙකුට කළ යුතු යුතුකම්</u> :

- මිනිසාට තනියෙන් ජීවත් විය නොහැක. සමූහයක් ලෙස ජීවත් විය යුතුය. ඒ අවස්ථාවල සහ මිනිසාට කළ යුතු යුතුකම් ප්‍රතික්ෂේප කළ නොහැක.
- ස්වාමි පුරුෂ, බිරිඳ, පියා, මව, පුතා, සහෝදරයන් ලෙස ඉටු කළ යුතු යුතුකම් ඉස්ලාම් මනාව පැහැදිලි කර ඇත.
- ගෘහ මූලිකයා ලෙස පවුල නඩත්තු කිරීම, දරුවන් උස් මහත් කර ගැනීට වෙහෙස වීම, ස්වාමි පුරුසයාට සහයෝග වීම කාන්තාවන්ගේ යුතුකමකි.
- අසල්වැසියන්, යහළුවන්ගේ යුතුකම් ඉෂ්ට කරන අතර, අනාතයන් වැන්දඹු, රෝගීන්, ආබාධිතයන් ට ද උපකාර වීම
- සුබසාධක ක්‍රියාවල නියැලී සිටීම (ළිඳ කැපීම, පාර කැපීම, පාසල් ඉදි කිරීම)
- ස්වාභාවික ආපදාවෙන් හා අසාමාන්‍ය අවස්ථාවන් හි සමාහර සුභ සාධක ක්‍රියාවල නියැලී සිටීම

<u>මිනිසා වෙනත් ජීවිතයන්ට කළ යුතු යුතුකම්</u>

- සතුන් හා භෞතික සම්පත් විධිමත්ව භාවිතා කිරීම
- විශ්ව සමබරතාවය කඩාකප්පල් නොකිරීම
- සතුන් සමග හොඳින් සිටීම
- ඔවුන්ට හිරිහැර නොකිරීම, විනාශ නොකිරීම
- මැවින්වටල ආදරය දක්වීම, ආරක්ෂාව ලබා දීම, ආහාර පාන ලබා දීම
- මිනිසාට හිරිහැර කරන සතුන් වධ හිංසා නොකිරීම. ගිනි නොතිබීම
- ඝාතනය කිරීමේදී ඒ සිව්පාට පිහිය නොදක්වීම, ඝාහතනය කළ සතාගේ ඉදිරියේ වෙනත් සතෙක් ඝාතනය නොකිරීම, පිහිය තියුණුව තබා ගැනීම.

**(හුකූකුල් ඉබාද් පිළිබඳ විග්‍රහය හා හැඳින්වීමට ලකුණු 02 ක් ද සෑම අංශවලම උදාහරණයෙන් විග්‍ර කර ඇත්නම් ලකුණු 04 ක් ද මුළු ලකුණු 10 ක් ලබා දෙන්න.)**

**8.** පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය (ලකුණු 05 යි.)

- ලංකාවේ යුනානි වෙදකම හඳුන්වා දී එය ප්‍රවර්ධනය කර අළුත් කලාවක් පත් කළේ මුස්ලීම්වරුන්ය.
- ක්‍රි.ව 9.10 සියවසේ වෙරළ බඩ ප්‍රදේශයේ ජීවත් වූ අරාබිවරුන් මගින් මෙම යුනානි වෙදකම හඳුන්වා දී ඇති බව විශ්වාස කෙරේ.
- ක්‍රි.ව දහවැනි සියවසේ කොන්සසුල්තාන්ගේ පුත් ජමාල්දීන් සහ ඔහුගේ පුත්‍රයන් (බෙරුවල හි වාසයකළ) විසින් මෙම කලාව හඳුන්වා දී ඇති බව, අලෙක්සැන්ඩර් ජොන්ස්ටන් සඳහන් කරයි.
- මහාචාර්ය ලෝනා දේවරාජ මෙලෙස සඳහන් කරන්නේය.

දඹදෙනි රජ වූ දෙවන පරාක්‍රමබාහු (ක්‍රි.ව 1236 - 1270) තම 22 පාලන වර්ෂයේ දී කතා කිරීමට නොහැකි තත්ත්වයට පත්වූවේය. මෙම රජතුමාගේ ඉල්ලුමකට අනුව ස්පාඤ්ඤ සම්බන්ධයක් ඇති වෛද්‍යවරයෙකු විසින් මෙම කලාව හඳුන්වා දෙනු ලැබූ බව මතයක් ඇත. වෛද්‍යරත්න ගෝපාල මුදලිගේ අත්සාර් ඉබ්නු තුෆෙල් උඩයාර් නම් මෙම වෛද්‍යවරයාගේ පරම්පාරව ලංකාවේ රාජ්‍ය වෛද්‍යවරුන් ලෙස සේවය කළෝය.

- භූගෝල විද්වතුන්වන අල් ඉද්රිසි යාකූද් අල්හමවි, අල් කස්විනී ලංකාවේ අපනයන ද්‍රව්‍යන් අතර ඖෂධ ද්‍රව්‍යන් ද තිබුණු බව සඳහන් කරති.
- සෙංකඩගල රාජධානියෙහි යුනානි වෛද්‍යවරුන් රජතුමාට ඉතා සමීපව ආශ්‍රය කළහ. මේ නිසා ඔවුන්ට තෑගි, වගකීම්, ගෞරව නාම ද පිදුම් ලබන ලදී.
- මෙයින් රාජපක්ෂ වෛද්‍යවරයාගේ ගෝපාල මුදලි, රාජකරුණා වෛද්‍ය තිලක ගෝපාල මුදලි යනාදි ගෞරවණීය නාම ප්‍රදානය කළෝය
- සෙංකඩගල රාජධානියෙහි උඩුනුවර, දුම්බර, මාතලේ, යටිනුවර ආදි ස්ථානවල රජු විසින් මොවුන් පදිංචි කරන ලදී.
- නුවර විතරක් නොව, කොළඹ, ගාල්ල, මාතර ආදි ප්‍රදේශවල ලන්දේසීන් නිර්මානය කළ රෝහල්වල මුස්ලිම් වෛද්‍යවරු සේවය කර ඇත.
- ක්‍රි.ව 1791 දී මීරාලෙබ්බේ මැස්තියාර්, සෙක් මරික්කාර්, සෙක් ලෙබ්බේ වැනි වෛද්‍යවරුන් මෙහි ප්‍රදානියා ලෙස සේවය කළහ.
- වර්තමානයේ යුනානි ක්‍රමය ලාංකික විශ්ව විද්‍යාලයේ පිළිගත් ක්ෂේත්‍රයක් ලෙස හා වෛද්‍ය විද්‍යාවේ එකක්යක් ලෙස ද පරිවර්තනය වී ඇත.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (ක්‍රි.ව 1749 - 178) කාලයේදී හා ඔහුට පසු කාලයේදී බෙහෙත්ගේ මුහන්දිරම් නිලමේ තනතුරු දරූ බොහෝ මුස්ලිම් වෛද්‍යවරුන් දැකිය හැකිය.
- ක්‍රි.ව 7 - 9 දක්වා සියවස්වල භාවිත කළ බෙහෙත් වර්ග ගබඩා කිරීම සඳහා පරිහරණය කරන ලද සාසනිය ඉස්ලාමිය මැටි භාණ්ඩවල නටඹුන් අනුරාධපුර, මිහින්තය ආදි ස්ථානයන්හි කරන ලද කැණීම් මගින් සොයා ගෙන ඇත.
- මෙය යුගානි බෙහෙත් වර්ග ලංකාවට ආනනයන කර ඇති බවට සාක්ෂියක් වය හැක.

(ii) කර්දුල් හසන් (ලකුණු 05 යි.)

- පොලි රහිත ණය ක්‍රමය කර්ලුල් හසන් වේ.
- ණය ලබාගන්නාට උපදෙස් ලබා දෙන ඉස්ලාමය ණය ලබා දෙන්නා ලෙස බලා ''කවරෙකු දෙවතාවක් ණය ලබා දීම එක් වතාවක් දන් දීම හා සමානය.'' යනුවෙන් පවසමින් දිරිගන්වයි.
- අල්කුර්ආන්හි අල්ලාහ් වෙනුවෙන් ඔබ අලංකාරව ණය ලබාදුන්හොත් එය ඔහු විසින් ඔබට බොහෝ වාරයක් කර දෙයි.
- ණය ලබාදීම උදව් උපකාරයක් මිස ඉපයීමේ ක්‍රියාවලියක් නොවේ.
- ණය ලබාදුන් තැනැත්තා ඊට වඩා වැඩියෙන් බලාපොරොත්තු වීම තහනම්ය.
- ණය ලාබදීම ඉමහත් සමාජ සත්කාරයකි.
- කෙනෙකු ණය ලබාදීමෙන් ණයකරුවෙකුගේ දුෂ්කරතාවය දුරු කිරීමට දායකවීම උතුම් පුන්‍යකරුමයක් සේ සලකයි.

**(මෙවැනි කරුණු 05 ක් විග්‍ර කර ලියා ඇත්නම් 1 x 5 = ලකුණු 05 ක)**

(iii) ඉස්ලාමීය ඉගැන්වීම් අනුව දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ යුතුකම් (ලකුණු 05 යි.)

මෙය බිර්රුල් වාලිදයින් ලෙස සඳහන් වේ. මෙය කොටස දෙකකට වෙන් කළ හැකිය.

- දෙමව්පියන් ජීවත්වන විට
  - ඔවුන්ගේ ඇරයුමට ප්‍රතිචාර දක්වීම
  - කරුණාවෙන් යුතුව කටයුතු කිරීම
  - කෘතවේදිව හැසිරීම
  - සිත රිදවන ප්‍රකාශයන හා ක්‍රියාවෙන් වැළකීම
  - මෘදු භාවයෙන් යුතුව කටයුතු කිරීම
  - අවනත වීම
  - ප්‍රාර්ථනා කිරීම
  - අන් අයගේ දෝෂාරෝපණයට ලක් නොකිරීම
  - ඔවුන්ගේ කැමැත්ත අකැමැත්ත අනුව ක්‍රියා කිරීම

- වියෝවෙන් පසු
  - අවසන් කටයුතුවල ඉටු කිරීම
  - ඔවුන් වෙනුවෙන් පාප සමාව අය දීම
  - ඔවුන්ගේ ගිවිසුම් පොරොන්දු, අවසන් කැමැත්ත ඉටු කිරීම
  - ඔවුන්ගේ ඥාතීන්ට ගෞරවය කිරීම
  - ඔවුන්ගේ මිතුරන්ට ගරු කිරීම
    (මෙවැනි කරුණු 05 ක් ලියා ඇත්නම් 05)

(iv) ප්‍රවේනි උරුම නීතියෙහි අල්-හජ්බ් (ලකුණු 05 යි.)

- ප්‍රවේනි උරුමකරුවන් (පසු උරුමකරුවන්) තමන්ට අදාළ කොටස් අඩුවෙන් ලබාන අවස්ථා ද මුළුමනින්ම අහිමි කරගන්නා අවස්ථා ද ඇති විය හැකිය. මෙම තත්ත්වය හජ්බ් නම් වේ.
- මෙසේ කොටස් ලැබීමට තහනම් කරන්නා හාජිබ් ලෙසද ගහනම් කරනු ලබන්නා මහ්ජුබ් ලෙසද හැඳින්වේ.
- මෙය කොටස් දෙකක් වේ.

1. හජ්බුන් මුක්සාන්

   ඇතැම් පාර්ශවයන් සිටින නිසා තවත් පාර්ශවයකගේ කොටස් අඩුවීම මෙයින් හැඳින් වේ.
   උදාහරණ :-
   මිය ගිය පුද්ගලයාට දරුවන් සිටියදී මියගිය පුද්ගලයාගේ සැමියා හෝ බිරිඳ යන අයට ලැබිය යුතු කොටස් අඩු වීම දක්විය හැක.

2. හජ්බුල් හිර්මාන්

   ඇතැම් පාර්ශවයන් සිටින බැවින් තවත් පාර්ශවයකගේ කොටස මුළුමනින්ම නැති වී යාම
   උදාහරණ :-
   මිය ගිය පුද්ගලයාට පුතෙකු සිටියදීම පුතාගේ පුතාට ලැබිය යුතු කොටස නොලැබී යාම.

(විග්‍රාහයට ලකුණු 02 ක් ද, කොටස් විග්‍රහ කරමින් ලියා ඇත්නම් ලකුණු 03 ක් ද, මුළු ලකුණු 05 ක් ද ලියා දෙනු)